පරිසර අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප



BDS
BIODIVERSITY
SECRETARIAT

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

Printing : EPA Advertising (Pvt) Ltd.

පරිසර අමාත්‍යාංශය
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

LIBRARY
MINISTRY OF ENVIRONMENT

# ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප

# ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප

පළාත් පුෂ්ප තේරීම සඳහා නිර්දේශ

## ජෛව විවිධත්වය පිළිබඳ ජාතික ප්‍රවීණයන්ගේ කමිටුව


සැකසුම

**ඊ. එම්. සුරම්‍යා ඒකනායක***

*වැඩසටහන් සහකාර (ගිවිසුම් සමායෝජනය) ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

**ප්‍රකාශනය** :
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
"සම්පත්පාය",
නො. 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**ප්‍රථම මුද්‍රණය** : 2006 මාර්තු
**දෙවන මුද්‍රණය** : 2016 දෙසැම්බර්

ISBN 955-9120-40-9

**පිටකවරය සැකසුම** :
ජී. එම්. සුරම්‍යා ඒකනායක

**මුද්‍රණය**
ජී.පී.ඒ. ඇඩ්වර්ටයිසින් ප්‍රයිවට් ලිමිටඩ්.,
835A, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

## ගරු පරිසර අමාත්‍යතුමාගේ පණිවිඩය ........

ජෛව විවිධත්වය අතින් පොහොසත් ශ්‍රී ලංකාව තුළ ආවේණික ශාක හා සත්ව විශේෂ ගණනාවකින් යුක්ත ය. මෑත දශකවලදී නොයෙකුත් මානව ක්‍රියා හේතුකොට ගෙන ජීවී විශේෂවලට එල්ලවන තර්ජන වැඩිවෙමින් පවතින හෙයින් ඒවායේ වඳවීයාමේ ප්‍රවණතාවයට මං පෑදී ඇත.

1994 වර්ෂයේ මාර්තු මස 24 වන දින ශ්‍රී ලංකාව විසින් ජෛව විවිධත්වය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සඳහා අනුමැතිය ලබාගත් අතර සම්මුතියේ සඳහන් පරිදි ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාත්මක සැලැස්ම සකස් කර රජය විසින් අනුමත කරන ලදුව 1999 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කෙරින.

ජෛව විවිධත්ව සම්මුතිය සඳහා වන ජාතික කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරන පරිසර අමාත්‍යාංශය සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක සැලසුම් හා නීති රෙගුලාසි සම්පාදනය මෙන් ම සංරක්ෂණය සඳහා මහජනතාව දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ විවිධ වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලබයි. පරිසර සංරක්ෂණය හෝ ජෛව විවිධත්ව සංරක්ෂණය "තනි ආයතනයක හෝ ආයතන කිහිපයක පමණක් වගකීමය" යන යල් පැනගිය සංකල්පය පසෙකලා, සංරක්ෂණයේ සැබෑ හවුල්කරුවන් වූ පොදු මහජනතාව සමඟ ඉදිරියට යෑම මගේ අරමුණයි.

සංරක්ෂණයේ ප්‍රතිලාභියන්ගේ සැබෑ උරුමකරුවන් වන්නේ පොදු මහජනතාවයි. පොදු ජනතාවගේ සහභාගීත්වයෙන් සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ඒ තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා එහි ප්‍රතිලාභ ජනතාවට භුක්ති විඳීමට සැලැස්වීම මාගේ අභියෝගය මෙන් ම යුතුකමක් ද කොට මා සලකමි.

විවිධ සංරක්ෂණ වැඩසටහන් සමූහයක් අතරින් තවත් එක් පියවරක් ලෙස, ශාක ජෛව විවිධත්වයේ චමත්කාරය දනවන එක් අංගයක් වූ "පුෂ්ප" වල පළාත් අනන්‍යතාවය හා එක් එක් පළාතේ ජනතාවගේ අයිතිය තහවුරු කරමින් වඳවීමේ තර්ජනයට ලක් වූ ශාක සංරක්ෂණය සඳහා මහජනතාවගේ සහය ලබාගැනීම පිණිස ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප තේරීම සඳහා දීප ව්‍යාප්ත තරගයක් පවත්වන ලදී.

"ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප" ග්‍රන්ථය ඉහත ක්‍රියාදාමයේ එක් නිර්මාණයක් වන අතර එය අනාගත පරම්පරාව තම පළාතේ ජෛව උරුමය හඳුනාගැනීමට හා ඒ තුළින් පළාත් ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ ආකල්ප වර්ධනයට මහඟු මෙහෙයක් ඉටුකරන බව මගේ විශ්වාසයයි. මෙම ග්‍රන්ථය අප රටේ ජෛව විවිධත්ව සංරක්ෂණයට මහත් රුකුලක් වේවා ! යි ප්‍රාර්ථනා කරමි.

**මෛත්‍රීපාල සිරිසේන**
පරිසර අමාත්‍ය

## ලේකම්තුමාගේ පණිවිඩය ........

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමත්, ස්වභාවික සම්පත් චිරස්ථායිව පරිහරණය කිරීමත් පරිසර අමාත්‍යාංශය නිරතුරුව ජය ගැනීමට පරිශ්‍රමය දරන අභියෝග වේ.

මෙම අභියෝග ජය ගැනීමේ දී රටවැසියන්ගේ සංරක්ෂණ ආකල්ප වර්ධනය කිරීම මෙන් ම පරිසර සංවේදීතාවන් ඇති කිරීම ඉතා වැදගත් කාර්යාංශයක් ඉටුකරයි. ගෝලීයකරණ ප්‍රවණතා තුළ දිනෙන් දින පිරිහෙන අදාළ චර්යාවන් නැවත ගොඩනැගීම කල හැකි එක් ආකාරයක් වන්නේ රටේ, ජාතියේ උරුමයන්ගේ සුවිශේෂ වැදගත්කම වටහා දීම තුළින් හා ආකල්ප සංවේදීතාවය ඇති කිරීම ද මගිනි.

එකිනෙකට වෙනස් ජෛව, සංස්කෘතික හා ආගමික වෙනස්කම් සහිත ශ්‍රී ලංකාවේ පළාත් සැලකූ විට, ඒවායේ ද පළාතට සුවිශේෂී වූ ජෛව සම්පත් බොහෝමයක් ඇත. මෙම සුවිශේෂී ජෛව සම්පත් පිළිබඳව ජනතාව තුළ අවබෝධයක් ඇති කිරීම, අදාල ජන කොටස්වලට එම සුවිශේෂී ජෛව සම්පත් තුළින් ගොඩනැගෙන අනන්‍යතාවේ අයිතිවාසිකම පිළිබඳව හැඟීමක් ඇති කිරීම මගින් පොදුවේ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණයට මහඟු මෙහෙයක් ඉටුකළ හැකි ය.

පරිසර අමාත්‍යාංශය විසින් සම්පාදිත "ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප" නමැති මෙම ග්‍රන්ථයෙන් ඉහත දක්වූ කාලීන අවශ්‍යතාව ඉටුකරන බව කිව හැකි ය.

මෙම ග්‍රන්ථයේ මූලික අරමුණ සුවිශේෂී පළාත්බද ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසාර භාවිතය යි. මෙයට අමතරව මෙම සංරක්ෂණ ක්‍රියාවලියේ දී උපරිම කාර්යභාරයක් ඉටුකළ හැකි පාසල් සිසුන් මෙන් ම තම පළාතේ සුවිශේෂී ජෛව අනන්‍යතාව හඳුනා ගැනීමට පොදුවේ ඒ ඒ පළාත්වාසීන් ඇතුළු සාමාන්‍ය ජනතාවට ද මෙම ග්‍රන්ථය උපකාරී වන බව නොඅනුමාන ය.

විශේෂයෙන් ම එක් එක් පළාත් නියෝජනය වන පරිදි ශ්‍රී ලංකාවේ ආවේණික හෝ දේශීය මෙන් ම වඳවීමේ තර්ජනයට මුහුණපා ඇති

ශාකවල පුෂ්ප එකතුවක් ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කරමින් ඒවායේ වැදගත්කම හා වටිනාකම විග්‍රහ කරන මෙම කෘතිය ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා මහෝපකාරී වන බව කිව යුතුම ය.

පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ ප්‍රකාශනයක් ලෙස එළිදක්වෙන මෙම ග්‍රන්ථය මුද්‍රණය සඳහා මූල්‍ය අනුග්‍රහය දක් වූ ශ්‍රී ලංකාවේ පරිසර වැඩසටහන් පිළිබඳ ආයතනික ශක්තීන් වර්ධනය කිරීම හා හැකියාවන් ගොඩනැගීම සඳහා වූ නෙදර්ලන්ත ව්‍යාපෘතිය කාලීන අවශ්‍යතාවක් ඉටු කිරීමේ මහඟු දායකත්වයක් සපයා දුන් බව කෘතඥතාපූර්වකව සිහිපත් කරමි.

**ජයලත් ර. වි. දිසානායක**
ලේකම්
පරිසර අමාත්‍යාංශය

# පෙරවදන

මෑත කාලයේදී පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රධාන දාර්ශනික ප්‍රවේශ දෙකක්වත් හඳුනාගත හැකි බව විවිධ විද්වතුන් විසින් පෙන්වා දෙන්නට යෙදුනි. එනම් "ගැඹුරු පරිසර විද්‍යාත්මක ප්‍රවේශය" සහ "නොගැඹුරු ප්‍රවේශය" යන චින්තන ධාරා දෙකයි. මෙයින් ගැඹුරු පරිසර විද්‍යාත්මක ප්‍රවේශයෙන් කියැවුනේ ලෝකයේ පවතින පරිසර ප්‍රශ්නවලට මුල මිනිස් චිත්ත සන්තානයෙහි ම උපදින බවයි. මේ චින්තන ධාරාවට යොමු වූ චින්තකයන් කියා සිටියේ, ලෝකයේ ඇති ස්වභාවික සම්පත් මූලික මිනිස් අවශ්‍යතා සපුරාලීමට ඇති තරම් සෑහෙන බවත්, එහෙත් මිනිසා තුළ ජනිත වන තණ්හාව සංසිඳවීමට නම් ඒවා කොපමණ තිබුණත් නොසෑහෙන බවත් ය.

දෙවැනි චින්තන මාර්ගය වූ නොගැඹුරු පරිසර විද්‍යාත්මක ප්‍රවේශයෙන් කියැවුනේ අද ලෝකයේ පරිසර සංරක්ෂණය සඳහා පවතින බොහෝ වැඩසටහන්, විටින් විට පැන නගින පරිසර අර්බුදයන්ට ප්‍රතිකර්ම වශයෙන් නිර්මාණය වී ඇති ඒවා බවයි. මේවා බොහෝවිට ස්ථානීය හා තාවකාලික ප්‍රතිඵල ගෙන දේ. අද බොහෝ රාජ්‍ය සංවිධාන මෙන් ම රාජ්‍ය නොවන සංවිධානවලින් ද ඉටුකෙරෙන කාර්යයන් මේ ගණයට වැටේ. ලෝක පරිසර දින වැඩසටහන්, රුක් රෝපණ සති, පරිසර හානිය මැඩපැවැත්වීමට අදාල අණපනත් පැනවීම්, ආර්ථික ප්‍රතිපත්ති මෙම නොගැඹුරු ප්‍රවේශයෙහි ම ප්‍රකාශනයන් වේ. මෙබඳු කාර්යයන්ගෙන් ද කෙටිකාලීනව ඇතැම් යහපත් ප්‍රතිඵල ළඟාකරගත හැකි බව පැහැදිලි ය. කෙසේ හෝ කුමන ප්‍රවේශ මාර්ගය ඔස්සේ ගමන් කල ද ලෝක මට්ටමින් මෙන් ම ස්ථානීය මට්ටමෙන් ද දිනෙන් දින උග්‍රවෙමින් පවතින පරිසර අර්බුදයට පැහැදිලි විසඳුම් ඉදිරිපත් වී ඇති බවක් නොපෙනේ.

පරිසර අර්බුදය නිසා එක් අතකින් ස්වභාවික සම්පත් ශීඝ්‍රයෙන් ක්ෂය වී යන අතර පරිසර දූෂණය ද බෙහෙවින් උග්‍රවෙමින් පවතී. මෙයින් පළමුවැන්න ලෝක ආර්ථිකයට මෙන් ම සමාජ-ආර්ථික සංස්ථාවන්ට ද අනිෂ්ඨ ප්‍රතිවිපාක ගෙන දේ. දෙවැන්න කෙතරම් උග්‍ර බවට පත් වී ඇත් ද යන්න මිහිතලය මත ජීවයේ පැවැත්මට පවා එල්ල වී ඇති බලවත් අභියෝගයන් තුළින් පෙන්නුම් කරයි.

පෘථිවියෙහි පවතින ජීව විවිධත්වය එකිනෙක ජීව-අජීව සංසිද්ධීන් හා බැඳී පවතින අතර, එහි සංරක්ෂණය මිනිස් සංහතියේ චිරස්ථිතිය සඳහා ඍජුව ම හේතුපාදක වන බව දැන් මැනවින් පැහැදිලි වී ඇත. ස්වභාව ධර්මයේ එම අපූරු නිර්මාණයන් රැකගැනීම සඳහා මිනිස් හදවත්වලට ම ආමන්ත්‍රණය කිරීමේ ක්‍රමවේද සොයා යාමට අද සිදුව ඇත.

විවිධ සම්පත් "තමාගේම ය", "තම පැවැත්මට අවශ්‍යය" යන චින්තාවන් මිනිස් සිත්-සතන් තුළ ප්‍රතිස්ථාපනය කරවීම ජෛව විවිධත්ව සංරක්ෂණයට මහෝපකාරී වන බව අපගේ අදහසයි.

ශ්‍රී ලංකාව ජෛව විවිධත්ව අතින් අනූන දේශයක් බව විවිධ විද්වතුන් මැනවින් පෙන්වා දී ඇත. එක් වර්ග කිලෝමීටරයකට වැටෙන සපුෂ්පික ශාක ඝනත්වය අතින් ශ්‍රී ලංකාව ආසියාකරයේ ඉහළ ම තැනකට පැමිණේ. මේ නිසා පළාත් පුෂ්පයන් තෝරාගැනීමේ යම් තරගකාරීත්වයක් ද පැන නැගීම අරුමයක් නොවේ.

මෙම චින්තන මාර්ගයට ම අවතීර්ණ වූ ජපානය වැනි ඇතැම් රටවලට ද ප්‍රාදේශීය පුෂ්පයන් හඳුනාගෙන ඇති අයුරු දක්නට ලැබේ. වරක් එසේ තෝරාගත් පසු එම පුෂ්ප විශේෂයෙන් උත්සව අවස්ථාවලදී ඒ ඒ ප්‍රදේශවල විශේෂයෙන් ප්‍රදර්ශනය කෙරේ. එසේ ම පළාත් පුෂ්පයන් මංගල කටයුතුවලදී මෙන් ම, සම්මන්ත්‍රණ හා සම්භාෂණවලදී ද ඉස්මතු කොට දක්වේ. ඇතැම් ප්‍රාදේශීය නායකයන් පවා සිය පළාත් පුෂ්ප පැළඳීමට හෝ ප්‍රදර්ශනය කිරීමට පෙලඹේ. ඒවා පිළිගැනීමේ අවස්ථාවල යොදාගන්නා මල් මාල සහ මල් කළඹවලදී ද ඉස්මතු කෙරේ. තවද ඈත අතීතයේ පටන් ම චිත්‍ර හා කලා ශිල්පවලට ද ප්‍රාදේශීය පුෂ්පයන් අන්තර්ගතවී ඇති අයුරු අප දනිමු. අද මේවා බතික් රෙදිපිළිවලට මෙන් ම විවිධ ප්‍රාදේශීය හස්ත කර්මාන්ත හා කලා ශිල්ප ආදියට ද යොදවා ගත හැකි ය.

විවිධ ප්‍රදේශවලට ආවේණික ගහකොළ, සතා සිවුපාවා සහ මිනිස් ප්‍රභේදයන් පවා රැකගත යුතු ය යන හැඟීම දීමට ඇති එක් මගක් වනුයේ, එම සුවිශේෂ ජීව පද්ධතිවලට ප්‍රාදේශිකත්වයක් ආරෝපණය කිරීමයි.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පුෂ්පයන් පිළිබඳව ලියැවී ඇති මෙම පොත් පිංච මේ රටටත් ලෝකයටත් දෙන පණිවිඩය එයයි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභා නවයක් හඳුනාගෙන ඒවාට අද සැහෙන දුරකට බලය බෙදාහැරදී ඇත. මේ බලතල ඉදිරි කාලයේ දී තවදුරටත් වර්ධනය වීමේ ප්‍රවණතාවක් දැන් පවතී. මේ නිසා එක් එක් පළාත්වල ඊට ම සුවිශේෂී වූ පුෂ්පයක් හඳුනාගත යුතු ය යන යෝජනාව දැනට වසරකට පමණ පෙරදී ජෛව විවිධත්වය පිළිබඳ ජාතික ප්‍රවීණයන්ගේ සභාවෙන් සම්මත කෙරින. එම යෝජනාව උත්පාදනය කිරීමටත්, ඉදිරියට ගෙනයාමටත් සම්මාදම් වීමට ලැබීම ගැන, එම සභාවේ සංස්කෘතික ජීව විවිධත්ව පිළිබඳ හඬක් නංවන කෙනෙකු වශයෙන් මම ඉමහත් සතුටට පත්වෙමි.

මෙම කර්තව්‍යය මුලදී සිතූ තරම් පහසු එකක් නොවූ බව මෙහිදී කිව යුතු ය. මේ සම්බන්ධයෙන් ජනමත විමසීමේ දී ලැබූ අතිවිශාල ප්‍රතිචාරයන් අතුරින් කිහිපයක් පමණක් තෝරා ගැනීමටත් ඒ සඳහා පළාත් සභාවල එකඟතාව ලබාගැනීමටත් තරමක් කල්ගතවීම පුදුමයට කරුණක් නොවේ. කෙසේවුව ද මෙම ක්‍රියාදාමය කිසියම් අවසානයක් කරා දැන් ළඟාවෙමින් පවතින හෙයින්, ඒ පිළිබඳ කෙටි වාර්ථාවක් මෙම පොත් පිංචෙන් ඉදිරිපත් කෙරී ඇත.

මෙම මහඟු කාර්යයට අතහිත දුන් සියළුදෙනාටත්, විශේෂයෙන් ම ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයට, එහි අධ්‍යක්ෂතුමාට සහ මෙම පොත් පිංචේ සම්පාදකටත් සැමගේ ප්‍රණාමය හිමි විය යුතු බව අපගේ විශ්වාසය යි.

**මහාචාර්ය සී. ඇම්. මද්දුමබණ්ඩාර**
සරසවි උයන
පේරාදෙණිය.
2006.01.24

## පටුන


**පරිසර අමාත්‍යතුමාගේ පණිවිඩය** v

**ලේකම්තුමාගේ පණිවිඩය** vi

**පෙරවදන** ix

**හැඳින්වීම** 1

මානෙල් 6
*Nymphaea nouchali* **Burm.f.**
ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය

1. ඇට්ටේරියා 8
*Murraya paniculata* **(L.) Jack**
වයඹ පළාත - පළාත් පුෂ්පය

2. ඇහැළ 10
*Cassia fistula* **L**
උතුරු-මැද පළාත - පළාත් පුෂ්පය

3. ගොඩ මානෙල් 12
*Crinum latifolium*
නැගෙනහිර පළාත - පළාත් පුෂ්පය (යෝජිත)

4. ගුරුළුරාජ 14
*Rhynchostylis retusa* **Blume**
ඌව පළාත - පළාත් පුෂ්පය

5. මහරත්මල 16
*Rhododendron arboreum* **Seem. Subsp.**
*zeylanicum* **(Booth.) Tagg.**
මධ්‍යම පළාත - පළාත් පුෂ්පය

6. වල් පිච්ච 20
*Jasminum angustifolium* **(L.) Willd.**
උතුරු පළාත - පළාත් පුෂ්පය (යෝජිත)

7. වෙසක් මල් 22
*Dendrobium maccarthiae.* **Thw.**
සබරගමුව පළාත - පළාත් පුෂ්පය

8. විශ්ණු ක්‍රාන්ති 24
*Evolvulus alsinoides* **(L.) L.**
උතුරු පළාත - පළාත් පුෂ්පය (යෝජිත)

9. සුදු නෙළුම් 26
*Nelumbo nucifera* **Gaertn.**
බස්නාහිර පළාත - පළාත් පුෂ්පය

10. හීන් බෝවිටියා 30
*Osbeckia octandra*
දකුණු පළාත - පළාත් පුෂ්පය

පරිශීලන ග්‍රන්ථ 32

# හැඳින්වීම

මිහිතලය මත සිදුවූ ජෛව පරිණාමික ක්‍රියාවලියේ එක් ප්‍රතිඵලයක් ලෙස අවුරුදු කෝටි ගණනක සිට වෙනස් වෙමින් පැවත එන විවිධ ජීවී ස්වරූපයන් දස දහස් ගණනක් බිහි වී ඇත. භූගෝලීය සීමාවන් අතර මෙම ජීවයේ ස්වරූපය විශාල පරාසයක වෙනස්කම් පෙන්වන අතර, මිහිතලයේ භූ-දේශපාලන සීමාවන් අතර ද ඉහත කී වෙනස්කම්වලට අමතරව එක් එක් සීමාවලින් වෙන් කරන රාජ්‍යයන් සඳහා මෙම ජීවයේ ස්වරූපයන් සුවිශේෂී අනන්‍යතාවන් පෙන්වන අවස්ථා ද දක්නට ඇත. මෙම ජීව ස්වරූපයේ වෙනස තුළින් ගොඩනැගී ඇති ජෛව විවිධත්වයේ ස්වභාවික වැදගත්කම පිළිබඳ ජනතාවගේ අනවබෝධය නිසා එම සුවිශේෂී තත්ත්වයන් ලොවට අනාවරණය වීමටත් පෙර හෝ සීමිත අනාවරණයක් තුළ වැනසී යාමේ ප්‍රවණතාවයක් වර්තමානයේ දක්නට ඇත.

සුවිශේෂී ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසාර භාවිතය පිණිස බොහෝ රාජ්‍යයන් තම රටේ ආවේණික ජෛව විවිධත්ව අනන්‍යතාව පිළිඹිබු කිරීමට යොදාගැනීම අතීතයේ මෙන් ම වර්තමානයේදී ද සුලභව දක්නට ඇත. මෙම චින්තන ප්‍රවාහයට අනුකූලව ශ්‍රී ලංකාවේ ද මෙයට දශකයකට පමණ පෙර ජාතික අනන්‍යතාව හුවා දැක්වීම සඳහා ජාතික පුෂ්පය හා වෘක්ෂය ප්‍රකාශයට පත් කර ඇත.

ලෝකයේ අනෙකුත් රටවල් හා සැසඳුව කල ශ්‍රී ලංකාව සාපේක්ෂව කුඩා දිවයින් රාජ්‍යයක් වුවත් දේශගුණය, පස, භූ විෂමතාව වැනි භෞතික සාධකවල හා සංස්කෘතික හා ආගමික පසුබිම මත ගොඩනැගුනු සාධකවල විචල්‍යතාවන් නිසා සුවිශේෂී ප්‍රාදේශීය ජෛව-සංස්කෘතික විවිධත්වයක් ගොඩනැගී ඇත. මෙම පළාත්බද ජෛව විවිධත්වයන් පිළිබඳ දැනුම, එහි වැදගත්කම හා වටිනාකම පිළබඳව ඒ ඒ පළාත් වාසීන් තුළ ඇත්තේ සමස්ථයක් වශයෙන් ගත් කල ඉතා අල්ප අවබෝධයකි. රටේ

ජාතික ජෛව අනන්‍යතාව පිළිබඳ ජනතාව තුළ සැලකිය යුතු අවබෝධයක් තිබුණ ද ඉහත දක් වූ මන්දාවබෝධය නිසා ජෛව සංරක්ෂණය මෙන් ම තිරසාර භාවිතයටත් අහිසි බලපෑම් ඇතිවේ.

මෙම ගැටළුවට පිළියමක් වශයෙන්, පරිසර අමාත්‍යාංශය හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය එක්ව ඉහත කී පළාත්බද ජෛව-විවිධත්වයේ සුවිශේෂීතාවය අනුව එක් එක් පළාතට ජෛව අනන්‍යතාවක් ලබාදීමට හා පළාත්බද ජෛව විවිධත්වය සංරක්ෂණයට හා තිරසාර භාවිතයට අළුත් මඟ පෙන්වීමක් කිරීමට තීරණය කරන ලදී.

ඉහත මඟපෙන්වීමට අනුව, ජෛව විවිධත්වයේ වඩාත් ම චමත්කාරය දනවන එක් අංගයක් වූ "පුෂ්ප" තුළින් පළාතක ජෛව අනන්‍යතාවය පිළිඹිබු කිරීම පිණිස, ජාතික ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රවීණයන්ගේ කමිටුවේ උපදෙස් මත හා අදාල පළාත් සභාවේ අනුමැතිය සහිතව "පළාත් පුෂ්ප" හඳුන්වාදීමට කටයුතු කරන ලදී.

ඉහත පළාත් පුෂ්ප ප්‍රකාශයට පත් කිරීම සඳහා ලෝක ජෛව විවිධත්ව දිනය (මැයි 22) සැමරීම තේමා කොට පුවත්පතක (විදුසර විද්‍යා සඟරාවේ) පල කරන ලද දැන්වීමක් මඟින් පවත්වන ලද දීප ව්‍යාප්ත තරගයක් තුළින් ජනතා සහාගීත්වය ලබා ගන්නා ලදී. මෙම සමස්ථ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස පළාත් පුෂ්ප හඳුනාගැනීමේ මඟට අවතීර්ණවීමට හැකිවිය.

පළාත් පුෂ්ප තීරණය කිරීමේ නිර්ණායක ලෙස, පුෂ්පය දරන ශාකයේ ආවේණික බව, තර්ජනයට ලක්ව තිබීමේ තත්ත්වය, අදාල පළාතේ පරිසර පද්ධතිය තුළ කැපී පෙනෙන ස්වභාවය යන සාධක ද, පුෂ්පයේ බහුවිධ භාවිතය, ශාකය හෝ පුෂ්පය හා බැඳුනු සංස්කෘතික, ආගමික වටිනාකම් ආදිය පිළිබඳව ද සැලකිල්ල යොමුකරන ලදී.

තවමත් එකඟතාවකට එළඹීමට නොහැකි වූ පුෂ්පයන් "යෝජිත පළාත් පුෂ්ප" ලෙස මෙම ග්‍රන්ථයේ සටහන් කර ඇත.

මෙම පළාත් පුෂ්ප දරන ශාක, ජලජ මෙන් ම භෞමික ශාක ද නියෝජනය කරයි. භෞමික ශාක කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වෘක්ෂ, කාෂ්ඨීය පඳුරු, භූමිය වසා පැතිරෙන ධාවක, භූගත කඳන් සහිත ශාක මෙන් ම අපිශාක දක්වා පුළුල් පරාසයක පැතිර ඇත.

LIBRARY
MINISTRY OF ENVIRONMENT

| පුෂ්පයේ සාමාන්‍ය නම | පුෂ්පයේ උද්භිත විද්‍යාත්මක නම | කුලය | ඒකදේශීය / දේශීය බව |
|---|---|---|---|
| ඇට්ටේරියා | *Marraya paniculata* **(L.) Jack** | **Rutaceae** | දේශීය |
| ඇහැළ | *Cassia fistula* **L.** | **Febaceae** | දේශීය |
| ගොඩ මානෙල් | *Crinum latifolium* | **Amaryllidaceae** | දේශීය |
| ගුරුළුරාජ | *Rhynchostylis retusa* **Blume** | **Orchidaceae** | දේශීය |
| මහරත්මල් | *Rhododendron arboreum* **Seem.**<br>*Subsp. zeylanicum* **(Booth.) Tagg.** | **Ericaceae** | ඒකදේශීය |
| වල් පිච්ච | *Jasminum angustifolium* **(L.) Willd.** | **Oleaceae** | දේශීය |
| වෙසක් මල් | *Dendrobium maccarthiae.* **Thw.** | **Orchidaceae** | ඒකදේශීය |
| විශ්ණු ක්‍රාන්තිය | *Evolvulus alsinoides* **(L.) L.** | **Convolvulaceae** | දේශීය |
| සුදු නෙළුම් | *Nelumbo nucifera* **Gaertn.** | **Nelumbonaceae** | දේශීය |
| හීන් බෝවිටියා | *Osbeckia octandra* | **Melastomataceae** | ඒකදේශීය |

| | පුෂ්ප සැකසීම | | පුෂ්ප වර්ණය | | | | | | පුෂ්ප පිපෙන මාස | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුෂ්පයේ නම | පුෂ්ප මංජරී | තනි පුෂ්ප | සුදු | කහ | රතු | දම් | රෝස | නිල් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
| ඇට්ටේරියා | | * | * | | | | | | | | | | | | | | | | | |
| ඇහැළ | * | | | * | | | | | | * | * | * | * | * | * | | | | | |
| ගොඩ මානෙල් | | * | * | | | | | | | | | * | * | * | | | | | | |
| ගුරුළුරාජ | * | | * | | | | * | | * | * | * | * | | | | | | | * | * |
| මහරත්මල් | * | | | | * | * | | | | * | * | * | * | * | * | | | | | |
| වල් පිච්ච | | * | * | | | | | | | * | * | * | | | | | * | | | |
| වෙසක් මල් | * | | | | | * | | | | | | | * | * | | | | | | |
| විශ්ණු ක්‍රාන්තිය | | * | | | | | | * | | | | | | | | | | | | |
| සුදු නෙළුම් | | * | * | | | | | | | | | | | | | | | | | |
| හීන් බෝවිටියා | | * | | | | * | * | | | | | | | | | | | | | |

# ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය

මානෙල්

*Nymphaea nouchali* **Burm.f.**



**සිංහල** : මානෙල්
**දෙමළ** : නීලොත්පලම් (நீவொற்பழும்)
**ඉංග්‍රීසි** : Blue Water Lilly වේ.

මෙම පුෂ්පය ඉතා සියුමැලි, ලානිල් දම් පැහැයෙන් යුතුවේ. කුඩා පෙති 9-23 ක් වන අතර ලන්සාකාර ඉලිප්සාකාර හැඩයෙන් යුතුවේ. රේණු ප්‍රමාණය 8-40 ක් පමණ වේ. පත්‍රවල මතුපිට පෘෂ්ඨය කොළ පැහැ වන අතර ඇතැම්විට දම් පැහැති පුල්ලි ද දැකිය හැකි අතර පත්‍ර සෙ.මී. 60-80 පමණ විශ්කම්භයෙන් යුතුවේ. පත්‍රවල යට පෘෂ්ඨය තද දම් කොළ පැහැයකින් යුතු වේ. බීජ හා රෛසෝම මගින් අළුත් පැළ හටගන්නා අතර පත්‍රවලින් කුඩා ශාක හට නොගනී. ශ්‍රී ලංකාවේ වියළි, තෙත් හා අතරමැදි කලාපවල එතරම් සුලබ නොවන ආකාරයට ව්‍යාප්තව ඇත. ඒ අනුව උතුම් වූ නිල් පුෂ්පය "මානෙල්" ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය *Nymphaea nouchali* **Burm.f.**, නිශ්චිත ලෙස හා නිරවද්‍ය ලෙස හඳුනාගැනීම, භාවිතය හා සියළු ප්‍රකාශයන්හි නිවැරදි ලෙස භාවිතා කිරීම වැදගත් වේ.

**ස්වභාවය**
රෛසෝමීය කඳක් දරන ජලජ පැළෑටියකි.

**පත්‍ර**
රෛසෝමීය කඳින් පැන නැගුනු ජල ස්ථරය මත පාවෙන පත්‍ර සහිත ය. පත්‍රයේ උඩ පැත්ත සිනිඳු හා දිලිසෙන සුළු දීප්තිමත් කොළ පැහැයක් ගන්නා අතර පත්‍රයේ යටි පැත්ත දත දම් පැහැයට හුරු කොළ පැහැයක් ගනී. පත්‍ර මතුපිට සිනිඳු ය. කොළ පැහැති නාරටි දරයි. පත්‍ර තලය සෙ.මී. 10-30 x 10-26 ක ප්‍රමාණයක් ගන්නා අතර පත්‍ර තරමක ඡත්‍රීය වටකුරු හා වක්‍රාකාර හෝ අර්ධ වක්‍රාකාර ලෙස පත්‍ර පාදයේ හෘදාකාර කැපුමක් සහිතව පිහිටයි.

**පුෂ්ප**
පුෂ්ප නිල් පැහැයට හුරු දම් පැහැයක් ගන්නා අතර සෙ.මී. 15ක පමණ විශ්කම්භයකින් යුක්ත ය. රේණු ගණනාවකින් සමන්විත ය (16-30 දක්වා). පුෂ්ප පිපීමේ කාලය වසර පුරාම පවතින අතර පුෂ්ප ප්‍රසන්න සුවඳකින් සමන්විත ය. දවසේ හිරු උදාවේ සිට පෙරයම් සවස් කාලය දක්වා පුෂ්ප පිපේ.

**ප්‍රයෝජන**
- ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස නම් කර ඇත. එහෙත් මෙය සම්පූර්ණයෙන් ම ඒකදේශික ශාකයක් නොවේ.
- බෞද්ධ සිද්ධස්ථානවල පූජා කිරීම සඳහා යොදා ගැනේ. ජන කවි හා කලා ශිල්පවල සඳහන් වේ.
- පිෂ්ඨය සහිත රෛසෝමීය කඳන් පුළුස්සා ආහාර පිණිස යොදා ගැනේ. ඇතැම්විට ළපටි දඬු මැල්ලුම් සඳහා යොදා ගැනේ. පැසුණු ගෙඩි කෑමට ගනී.
- ශාකයේ රෛසෝමීය කඳ හා බීජ ආයුර්වේද ඖෂධ සඳහා යොදා ගැනේ.

1. ඇට්ටේරිය

*Murraya paniculata* **(L.) Jack**



පැඟිරි කුලයට (Rutaceae) හා කරපිංචා සනයට (Murraya) අයත් ඇට්ටේරියා ශාකය ඉංග්‍රීසි භාෂාවෙන් 'Orange Jasmine' ලෙස ද, මැලේ භාෂාවෙන් "Kamuning" ලෙස ද හැඳින්වේ. ඖෂධීය ශාකයක් වන මෙය, කළු දල, සුරබි, සීසප හා යාපුර යන ආදී නම් වලින් ද බෙහෙත් වට්ටෝරුවල හඳුන්වා දී ඇති අතර ශාකයේ උද්භිත විද්‍යාත්මක නම ඇන්ඩෘස් මුරේ නැමැත්තා විසින් 1940-1971 කාලයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

දේශීය ශාකයක් වන මෙය ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයේ සහ අතරමැදි කලාපයේ මුහුදු මට්ටමේ සිට උස මීටර 1,000 දක්වා දක්නට ඇත. වියළි පහතරට මෝසම් වැසි වනාන්තරවල වන ලැහැබ් තුළ සෙවන ඇති තැන්වල දක්නට ලැබෙන මෙම ශාකය විශේෂයෙන් ම ගල් තෙරුම්වල වැඩිපුර දිස්වේ. ඇට්ටේරියා ශාකය ආසියාවේ ඉන්දියාව, බුරුමය, ඉන්දුනීසියාව, මැලේසියාව ආදී රටවල ද ඕස්ට්‍රේලියාවේ ද දක්නට ඇත.

**ස්වභාවය**

ශාකය මීටර් 5ක් තරම් උසට වැඩෙන පඳුරක සිට කුඩා ගසක් දක්වා වර්ධනය වේ. ගොරෝසු සුදු පැහැති කඳක් සහිත ය.

**පත්‍ර**

තරමක් දුරට දෙහි කොළයක හැඩය ගත්, දිලිසෙන පත්‍ර ඇත. පත්‍ර සංයුක්ත ය. පත්‍රිකා සම්මුඛව නොපිහිටයි. පත්‍ර බිජුවට ආකාර සිට ඉලිප්සාකාර ආකාර දක්වා වෙනස් වේ. පත්‍ර මධ්‍යයේ ප්‍රධාන නාරටිය හා ඉන් පැන නැගුණු පාර්ශ්වි නාරටි යුගල් 5 සිට 8 දක්වා දක්නට ලැබේ.

**පුෂ්පය**

පුෂ්පය සුදු පැහැති ය. පෙති 5කි. සෙ.මී. 2ක පමණ විශ්කම්භයකින් යුක්ත ය. ප්‍රසන්න සුවඳක් දරන අතර පුෂ්ප සවසට පිපී, පසුදා සවස්වන විට පෙති හැලීයයි. දිගත පැතිරෙන ප්‍රසන්න සුවඳක් පෙරවරුව පුරාම ද ඇතැම්විට පවතී. පුෂ්ප පිපීමේ මාස අවිනිශ්චිත වේ. වෙනස්විය හැක. ඉත්තක මල් 2ක් හෝ 3ක් ලෙස පවතී.

**ප්‍රයෝජන**

- ශාකයේ කඳ (ලීය) අල්මාරි වැනි ගෘහ භාණ්ඩවල කැටයම් කැපීම සඳහා භාවිතා කෙරේ.
- පෝච්චිවල වවා විසිතුරු පැළෑටියක් ලෙස අලෙවි කරනු ලැබේ.
- බුරුමය වැනි රටවල් මෙම ශාකයේ පොත්ත සුවඳ විලවුන් සඳහා ද යොදා ගැනේ.
- ඇට්ටේරියා ශාකයේ පොත්තෙහි සාරය ආමාශයික යුෂ උත්තේජකයක් මෙන් ම ජීර්ණකයක් ලෙස ද විශ්වාස කෙරේ.

## 2. ඇහැළ / ඇසල

## *Cassia fistula* L.



රනිල (Febaceae / Leguminosae) කුලයට හා තෝර (Cassia) සනයට අයත් ඇහැළ ශාකය ඉංග්‍රීසි භාෂාවෙන් "Showers of gold" ලෙස ද, දෙමළ භාෂාවෙන් "Tirukkontai" (තිරුක්කොන්තායි), "Kavani" (කවානි) සහ "Konnei" (කොන්නි) ලෙස ද හඳුන්වනු ලැබේ. දකුණු හා නැගෙනහිර ආසියාවට ආවේණික ගසක් වන ඇහැළ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය වනාන්තරවල බහුලව දක්නට ඇති දේශීය ශාකයක් වන අතර ඉන්දියාව, මැලේසියාව, ජාවා සහ පිලිපීනය වැනි රටවල ද දක්නට ඇත.

**ස්වභාවය**

මීටර් 5 පමණ උසින් යුත් මධ්‍යම ප්‍රමාණයේ ගසකි. කඳෙහි පොත්ත අළු-දුඹුරු පැහැයක් ගන්නා අතර ලීය කහ-රතු පැහැයට හුරු ය.

**පත්‍ර**

පත්‍ර සෙ.මී. 10 සිට 40 දක්වා දිගින් යුක්ත වන අතර පත්‍රිකා යුගල් 3 සිට 8 දක්වා දරයි. පත්‍රිකා දිගටි ඕවලාකාර හෝ දිගටි ලංසාකාර හැඩයක් ගන්නා අතර සෙ.මී. 6 සිට 10 දක්වා දිගකින් ද සෙ.මී. 3 සිට 9 දක්වා පළලකින් ද යුක්ත ය.

**පුෂ්ප**

සෙ.මී. 30 පමණ දිග අක්ෂීය පුෂ්ප මංජරියකි. එක් මංජරියක පුෂ්ප ගණනාවක් ඇති අතර සෙ.මී. 2 සිට 3.5 දක්වා දිගකින් ද සෙ.මී. 1 සිට 2 දක්වා පළලකින් ද යුත් විශාල පුෂ්ප වේ. පුෂ්ප දීප්තිමත් කහ පැහැයක් ගන්නා අතර ඉති ලෙස සැකසී දිගු නටුවක් සහිතව පොකුරු ලෙස නමා හැලේ. පුෂ්ප පිපීම පෙබරවාරි සිට අගෝස්තු මාසය දක්වා වේ.


**ප්‍රයෝජන**

- විසිතුරු ශාකයක් ලෙස උද්‍යාන හා නගර අලංකාරයට යොදා ගැනේ.
- පුෂ්ප ආගමික උත්සවවල දී සැරසිලි සඳහා ද පූජා කිරීම සඳහා ද යොදා ගැනේ.
- ගසේ පොත්ත හම් පදම් කිරීමේ දී ඩයි වර්ගයක් ලෙස භාවිතා කෙරේ.
- මුල් හා කරල් (ඇට) ආයුර්වේද විරේකයක් ලෙස යොදා ගැනේ.
- ආගමික හා සංස්කෘතික වශයෙන් විශාල බැඳීමක් ඇති මෙම පුෂ්පය ලිත් වර්ෂයේ ජූලි මාසය සිංහල භාෂාවෙන් නම් කිරීමේ දී "ඇහැළ / ඇසළ" ලෙස යොදා ගෙන ඇත.
- ඇසළ කඳන් අතීතයේ වරිච්චි බිත්ති සඳහා කල් පවතින දුව වර්ගයක් ලෙස යොදා ගැණුනු අතර ශ්‍රී දළදා මාළිගාවෙහි, පැරණි බිත්තිවලට ද යොදා ගෙන ඇත.
- ඇසළ පෙරහැරේ "කප් සිටුවීමේ" මංගල්‍යයට ද ඇසළ භාවිතා කෙරේ.

## නැගෙනහිර පළාත - පළාත් පුෂ්පය (යෝජිත)

3. ගොඩ මානෙල්

*Crinum latifolium*



'Amaryllidaceae' කුලයට හා 'Crinum' ඝනයට අයත් ගොඩ මානෙල් සිංහල භාෂාවෙන් 'තොලබෝ' යන නමින්ද හඳුන්වනු ලබන අතර, දෙමළ භාෂාවෙන් 'Vichamunkil' (විචාමුන්කිල්) ලෙස ද, සංස්කෘත භාෂාවෙන් 'චක්‍රාංගි', 'සෝමවල්ලි' යන නම් වලින් ද හඳුන්වනු ලබයි. වියළි කලාපයේ තෙත් බිම් ආශ්‍රිතව විශේෂයෙන් වර්ෂා කාලය තුළ දී ගොඩ මානෙල් බහුලව දක්නට ලැබේ. දේශීය ශාකයක් වන මෙය ඉන්දියාව, අප්‍රිකාව වැනි රටවල ද ව්‍යාප්තව ඇත.

**ස්වභාවය**

ඕවලාකාර හෝ අර්ධවෘත්තාකාර සෙ.මී. 6 සිට 12ක පමණ දිගින් යුත් බල්බීය කඳ සෙ.මී. 15ක් පමණ දිග ව්‍යාජ කඳ දක්වා ක්‍රමයෙන් සිහින්ව ඇත.

**පත්‍ර**

පත්‍ර වල උඩ පැත්ත දීප්තිමත් කොළ පැහැයක් ගන්නා අතර යටි පැත්ත අඳුරු කොළ පැහැති ය. පත්‍ර දිගටි ලංසාකාරය. මීටර් 10 ක පමණ පළලකින් හා මීටර් 1ක පමණ දිගකින් යුක්ත ය. පත්‍රවල දික් අතට වැටී ඇති පැහැදිලිව සටහන් වූ නාරටි සහිතයි.

**පුෂ්ප**

පුනීලාකාර හැඩති, සුදු පැහැති පුෂ්පවල දළ පත්‍ර මධ්‍යයේ පළල් දම් පැහැති ඉරක් වැටී ඇති අතර එය පුෂ්පයේ පිට පැත්තේ තරමක් තද පැහැයෙන් ද ඇතුල් පැත්තේ තරමක් ලා පැහැයෙන් ද දිස්වේ. පුෂ්ප සිහින් සුවඳකින් ද යුක්ත වන අතර මල් පිපීම සවස් කාලයේ දී සිදුවේ. වියළි කලාපයේ අගෝස්තු සිට පෙරවාරි දක්වා මාසවල දී වැව් සහ දියකඩිති ආශ්‍රිතව දක්නට ලැබේ.

**ප්‍රයෝජන**

- බල්බීය කඳ හා පත්‍රවල යුෂ ඖෂධ ලෙස භාවිතා කෙරේ.
- මල් බඳුන් සැරසීමට භාවිතා කෙරේ.

## ඌව පළාත - පළාත් පුෂ්පය

### 4. ගුරුළුරාජ

### *Rhynchostylis retusa* **Blume**



ගුරුළුරාජ අපිශාකය උඩවැඩියා (Orchidaceae) කුලය හා රින්කොස්ටයිලිස් (Rhynchostlis) ඝනයට අයත් වේ. මෙම ශාකය ඉංග්‍රීසි භාෂාවෙන් "Foxtail Orchid" හා "Batticaloa orchid" යන නම්වලින් ද හඳුන්වනු ලබයි. මෙය වන සත්ව හා වෘක්ෂලතා අඥා පනත යටතේ ආරක්ෂිත පැළෑටි විශේෂයක් ලෙස නම් කර ඇත්තා වූ ද තර්ජනයට ලක් වූ ජීවීන් අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ II කාණ්ඩයට ඇතුළත් කර ඇත්තා වූ ද ශාකයකි. (මෙම කාණ්ඩය යටතේ වඳවී යාමේ තර්ජනයට දැඩි ලෙස මුහුණ දී නොමැති එහෙත් අන්තර්ජාතික වෙළෙඳාම පාලනයට ලක් කළයුතු ජීවීන් නම් කර ඇත.)

රින්කොස්ටයිලිස් ඝනයට අයත් ශ්‍රී ලංකාවේ දැකිය හැකි, එක ම දුර්ලභ උඩවැඩියා ශාකයක් වන මෙය ඌව සහ නැගෙනහිර පළාත්වල විශාල ගස් මත අපිශාකී ශාකයක් ලෙස ස්වභාවිකව දක්නට ලැබෙන අතර ඉන්දියාව, මැලේසියාව, බුරුමය (මියන්මාර්) සහ ජාවා වැනි රටවල ද දක්නට ලැබේ. දැනට ශීඝ්‍ර ලෙස වඳවෙමින් පවතින ගුරුළුරාජ, ඌව පළාතට සුවිශේෂී වනුයේ ඌව පළාතේ සැවනා පහත් බිම්වල ස්වභාවික ලෙස වැඩෙන බැවිනි.

**ස්වභාවය**

දැඩි, ඝනකම් පිටතට විහිදුනු පත්‍ර හැ දැඩි ඍජු කඳන් සහිත අපිශාකිය පඳුරකි. කඳ සෙ.මී. 25ක් පමණ උස සෙ.මී. 1ක් පමණ මහත ව්‍යාජ බල්බ රහිත කාෂ්ඨීය එකකි. කඳ පත්‍රවල පාදයන්ගෙන් වැසී ඇති අතර කඳේ අග්‍රය නොකඩවා වර්ධනය වෙමින් පරිණත කොටස් මැරී යයි. කඳේ පහළ කොටසින් තැනින් තැන වායුධර මුල් හටගෙන ඇති අතර ඇඟිල්ලක් තරම් මහත් වූ මේවා දිගු ය, අතු බෙදී ඇත. පැරණි කොටස්වලින් අතු හට ගැනීමක් ඇතැම්විට සිදුවේ. මෙලෙස පඳුරක් ලෙස වර්ධනය වේ.

**පත්‍ර**

කඳ දෙපස පත්‍ර ඒකාන්තරව විහිදේ. පහළට නැමී ඇත. පත්‍ර ඝනකම් ය. හම් වැනි ය. සෙ.මී. 15 සිට 37 පමණ දක්වා දිගකින් ද, සෙ.මී. 16 සිට 2 දක්වා පළලකින් ද යුක්ත ය. නාරටියෙන් ගැඹුරු ලෙස නැවුනු, දිගු පටි ආකාර පත්‍ර වේ. පත්‍ර අග්‍රය ගැඹුරු ලෙස බෙදී ඇත. එම ඛණ්ඩිකා තියුණු ය. අසමාන ය. පැරණි පත්‍ර ඒවායේ පත්‍ර පාද ඉතිරි කරමින් හැලී යයි.

**පුෂ්ප**

ශ්‍රී ලංකාවේ උඩවැඩියා විශේෂ අතුරින් ඉතාමත් අලංකාර වූ විශේෂයක් වන ගුරුළු රාජ, එහි සුවිශේෂ පුෂ්ප මංජරිය නිසා පහසුවෙන් හඳුනාගත හැකි වේ. පුෂ්ප මංජරියේ සෙ.මී. 2ක් පමණ පළලැති කුඩා පුෂ්ප විශාල සංඛ්‍යාවක් ඝනව පොකුරු ගැසී පහතට එල්ලා හැලෙන අතර සුදු පැහැති පුෂ්පවල තද රෝස පැහැති පුල්ලි වැටී ඇත. පුෂ්ප මංජරිය සෙ.මී. 2 සිට 30 දක්වා දිගකින් හා සෙ.මී. 3.5ක පමණ පළලකින් දිස්වෙන අතර පුෂ්ප නොවැම්බර් සිට අප්‍රේල් මාස දක්වා පිපේ.

**ප්‍රයෝජන**

❀ අලංකාරය පිණිස නිවෙස්වල වවනු ලැබේ. ඖෂධීය ගුණයෙන් ද යුක්ත ය.

5. මහරත්මල

*Rhododrendron arboreum* **Seem. Subsp.** *zeylanicum* **(Booth.) Tagg.**



"Ericaceae" කුලයට හා "Rhododendron" ඝනයට අයත් මහරත්මල් ශාකය දෙමළ භාෂාවෙන් "Billi" (බිල්ලි) යන නමින් ද හඳුන්වන අතර ශ්‍රී ලංකාවට ආවේණික ඒක දේශීය ශාකයකි. මීටර් 1,500ට වඩා උසින් යුත් ඉහළ කඳුකර කළාපයට අයත් වනාන්තරවල හා උස් පතන තණබිම්වල ද සුලභව ඇත.

**ස්වභාවය**

කුඩා ප්‍රමාණයේ සිට (මීටර් 3ක් පමණ) සිට මධ්‍යම ප්‍රමාණය (මීටර් 20ක් පමණ) දක්වා උසින් යුත් ශාකයකි. ශාකයේ කඳ මහත්ව ඇඹරී ඇති අතර කඳේ පාදීය පෙදෙස ඝනව පිහිටා ඇත. පොත්ත තද අළු පාට ය. ඝනකම් ය. ඝනව රැලි ගැසී ඇත. පාර්ශ්වික අතු ද ඇඹරී ශක්තිමත්ව පිහිටන අතර රිකිලි පැහැදිලි ලෙස පත්‍ර කැළැල් දරයි. මූල පද්ධතිය පොළව මට්ටමේ සිට සෙ.මී. කීපයක් පස තුළට දිවෙන නොගැඹුරු මුල් දරයි.

**පත්‍ර**

පත්‍ර මාංශලව හා ඉතා ඝනව පිහිටා ඇත. පත්‍රය එහි පාදය තරමක් රවුම්ව ද අග්‍රය තියුණු උල්ව ද පිහිටමින් ඉලිප්සාකාර සිට අණ්ඩාකාර දක්වා වූ හැඩයක් ගනී. පත්‍රයේ පටි පැත්ත බූ සහිත ය. පත්‍ර දැඩි ලෙස අවතල හැඩයක් ගනී. මැද නාරටිය පත්‍රයේ අවසානය දක්වා ම ගිලුනු ස්වභාවයකින් යුක්ත වන අතර ඉන් පැන නැගෙන පාර්ශ්වික නාරටි යුගල් 12 සිට 16 දක්වා දක්නට ලැබේ.

**පුෂ්ප**

සෙ.මී. 4.5ක පමණ විශ්කම්භයකින් යුත් අලංකාර පුෂ්ප මංජරියකි. කෙටි පුෂ්ප මංජරියක් වන මෙහි පොකුරු ගැසුණු පුෂ්ප 25ක් පමණ වන අතර ඒවා හිසක් ආකාරයට විශාලව වටකුරුව දිස්වේ. පුෂ්ප තද දම් පැහැයට හුරු රතු පැහැයක් ගන්නා පැහැදිලි විශාල ඒවා වේ.

පුෂ්ප පිපීම පෙබරවාරි සිට ජූලි දක්වා මාසවල දී සිදු වේ.

**ප්‍රයෝජන**

- උස් කඳුකර ප්‍රදේශවල මහරත්මල් භූ දර්ශනය අලංකාරවත් කරයි.
- මහරත්මල් ශාකයේ පත්‍ර ඖෂධ ලෙස ද යොදා ගැනේ.

උතුරු පළාත - පළාත් පුෂ්පය
(යෝජිත)

## 6. වල් පිච්ච

*Jasminum angustifolium* **(L.) Wild**



'Oleaceae' කුලයට හා 'Jasminum' ඝනයට අයත්, වල් පිච්ච, 'වෑ කන්ද' යන නමින් ද හඳුන්වන අතර, ඉංග්‍රීසි භාෂාවෙන් 'Wild Jasmine' ලෙස ද, දෙමළ භාෂාවෙන් 'Kattumalligai' (කට්ටුමල්ලිගයි) ලෙස ද හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවට මෙන් ම දකුණු ඉන්දියාවට ද ආවේණික ශාකයක් වන වල් පිච්ච, පහතරට වියළි කලාපයේ, උස්බිම්වල ඇති කැලෑ හා ලඳු ප්‍රදේශවල සුලභව දක්නට ඇත.

**ස්වභාවය**

මීටර් 3ක පමණ උසින් යුත් වැල් සහිත සදාහරිත කාෂ්ඨීය පඳුරක් වන මෙහි අතු, රිකිලි සිහින් බූ සහිත ය.

**පත්‍ර**

වල් පිච්ච ප්‍රතිවිරුද්ධ ලෙස පිහිටි කුඩා පත්‍රවලින් සමන්විත වේ. ඒවා සරල අතර පත්‍ර ගණනාවකින් යුක්ත ය. පත්‍රයේ පාදය දළ වශයෙන් මොටව හා අග්‍රය තියුණු ලෙස උල්ව පිහිටා ඇත. පත්‍ර තලය සිනිඳු ස්වභාවයක් ගන්නා අතර මැද නාරටිය සිහින් බූවක් දරයි. මැද නාරටියෙන් පැන නැගෙන පාර්ශ්වික නාරටි යුගල් 4 සිට 5 දක්වා පිහිටා ඇත.

**පුෂ්ප**

වල් පිච්ච ශාකය සුදු පැහැති පුෂ්පවලින් සමන්විත වේ. පුෂ්ප තනි තනිව හෝ 3 බැගින් අතු රිකිලි කෙලවර පිහිටන අතර බෙහෙවින් සුවඳවත් ය. මනාව වෙන්වූ පෙති 7ක් හෝ 8ක් දරන මේවා, මි.මී. 12 සිට 20 දක්වා විශ්කම්භයකින් යුක්ත ය. පුෂ්ප පිපීම පෙබරවාරි, මාර්තු, අප්‍රේල් හා සැප්තැම්බර් මාසවල දී සිදුවේ.

**ප්‍රයෝජන**

- ශාකයේ මුල් ඖෂධ ලෙසට යොදා ගැනේ.
- පුෂ්ප විසිතුරු ලෙස හා පූජනීය කටයුතුවල දී යොදා ගැනේ.

LIBRARY
MINISTRY OF ENVIRONMENT

## 7. වෙසක් මල

## *Dendrobium maccarthiae* **Thw.**



උඩවැඩියා (Orchidaceae) පවුලට අයත් 'Dendrobium' ඝනයට අයත් වෙසක් උඩවැඩියාව, ඒකදේශීක ශාකයක් මෙන් ම ශ්‍රී ලංකාවට පමණක් ආවේණික විශේෂයක් වේ. එය ශ්‍රී ලංකාවේ අධික වර්ෂාපතනයක් ලැබෙන රත්නපුර ප්‍රදේශයේ වන ලැහැබ්වල ස්වභාවිකව වැඩෙන දුර්ලභ මල් විශේෂයකි. වන සත්ව හා වෘක්ෂලතා ආඥා පතන යටතේ ආරක්ෂිත විශේෂයක් ලෙස ද තර්ජනයට ලක් වූ ජීවීන් අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ II වන කාණ්ඩයට ද (CITES II) වෙසක් ශාකය ඇතුළත් කර ඇත.

**ස්වභාවය**

පොකුරු වශයෙන් පිහිටි දිගට එල්ලෙන කඳන් සහිත අපිශාකයක් වන වෙසක් උඩවැඩියාව සාමාන්‍යයෙන් සෙ.මී. 16 සිට 60 දක්වා වර්ධනය වේ. කඳේ පාදයෙන් හටගන්නා සිහින් කෙඳි වැනි මුල් දරයි. කඳ සාමාන්‍යයෙන් සිහින් ය, දිගටි ය. ළපටි කඳ තරමක් ඍජු ස්වභාවයක් ගන්නා අතර පරිණත වන විට එල්ලෙන සුළු ය. සෙ.මී. 1ක් පමණ ඝන කඳෙහි සෙ.මී. 1 සිට 4 දක්වා පරතරයකින් යුතුව දෙපස මාරුවෙන් මාරුවට පිහිටි ගැට අසලින් පත්‍ර හට ගනී. කඳ පරිණතවත් ම මේවා ක්‍රමයෙන් හැලී යයි.

**පත්‍ර**

වෙසක් උඩවැඩියාවෙහි පත්‍ර රාශියකි. තද කොළ පැහැති ය. දිලිසෙන සුළු ය. පැහැදිලි නාරටි ගණනාවක් දැකිය හැකි මෙහි පත්‍ර සෙ.මී. 4 සිට 8 දක්වා දිගකින් යුක්තවේ. පත්‍ර පාදය කඳ වසාගෙන පැතිරී ඇත.

**පුෂ්ප**

සෙ.මී. 7.5ක් පමණ පළල් වේ. ලා දම් පැහැති ය. අධරය මධ්‍යයේ තද දම් පැහැති ලපයක් සහිත ය. පත්‍ර හටගන්නා දෙසට විරුද්ධ දෙසින් පුෂ්ප 2 සිට 4 දක්වා වූ පොකුරු වශයෙන් කෙටි අක්ෂයක් මත හට ගනී. එක් වරක දී කඳක පුෂ්ප මංජරි 1කට වැඩි ගණනක් හටගත හැකි ය. පුෂ්ප පිපීම මැයි ජුනි මාසවල සිදුවන බැවින් "වෙසක්" නම යෙදී ඇත.

**ප්‍රයෝජන**

- පුෂ්පය විසිතුරු පැළෑටියක් ලෙස වගා කෙරේ.

උතුරු පළාත - පළාත් පුෂ්පය
(යෝජිත)

8. විශ්ණු ක්‍රාන්ති

*Evolvulus alsinoides* **(L.) L.**



'Convolvulaceae' කුලයට හා 'Evolvulus' ඝනයට අයත් විශ්ණු කාන්තිය, දෙමළ භාෂාවෙන් (විශ්ණු කිරන්දි) (Vishnu-kirandhi) ලෙස ද හඳුන්වයි. දේශීය ශාකයක් වන මෙය වියළි හා අතරමැදි කලාපයේ පහත් බිම් වල දක්නට ඇත.

**ස්වභාවය**

බිම වැතිරී හෝ එල්ලා වැටී වැඩෙන, කුඩා පඳුරක් හෝ පැළැටියක් ලෙස වැවේ. මල් දරන කුඩා අතු පමණක් ඉහළට එසවී ඇති අතර ඒවා සේද වැනි වැස්මකින් ආවරණය වී ඇත.

**පත්‍ර**

පත්‍ර ඉලිප්සාකාර සිට රේඛීය-ආයත හැඩයක් ගනී. පත්‍රවල පත්‍රපාදය හා අග්‍රය තීව්‍ර සිට වටකුරු ලෙස සැකසී ඇති අතර මිලි මීටර් 8 සිට 26 දක්වා පමණ දිගින් යුක්ත ය. පත්‍ර වෘන්ත කෙටි ය. පත්‍රයේ උඩු හා යටි පැත්තේ සේද වැනි රෝම දරයි.

**පුෂ්ප**


කිනිත්තක පුෂ්ප 1 සිට 5 දක්වා ප්‍රමාණයක් පිහිටයි. මිලි මීටර් 4 සිට 5ක පමණ දිගකින් ද මිලි මීටර් 1ක් පමණ පළලකින් ද යුත් මෙම පුෂ්පවල පෙති ඕවලාකාර සිට ලංසාකාර දක්වා වූ හැඩයකින් යුක්ත ය. නිල් පැහැති පුෂ්ප වේ.

**ප්‍රයෝජන**

- විශ්ණු ක්‍රාන්ති පැළැටිය ආයුර්වේදයේ, ඖෂධ ලෙස භාවිතා කෙරේ.
- මුල්වලින් ලබාගන්නා සාරය ද පාචනය සිට මානසික රෝග දක්වා රෝග ගණනාවකට ම ඖෂධ ලෙස යොදා ගැනේ.
- දුම් ගසන ලද ශාකයේ පත්‍ර ඇදුම සඳහා ද ඖෂධ ලෙස යොදා ගැනේ.

## 9. සුදු නෙළුම්

*Nelumbo nucifera* **Gaertn.**



'Nelumbonaceae' කුලයට හා 'Nelumbo' ඝනයට අයත්, ඉංග්‍රීසි භාෂාවෙන් 'Lotus or Sacred bean' ලෙස ද, දෙමළ භාෂාවෙන් 'Tamarai' ලෙස ද හැඳින්වෙන නෙළුම් ශාකය, සංස්කෘත භාෂාවෙන් කමලා, පද්මා යන ආදී නම් ගණනාවකින් ම හඳුන්වනු ලබයි.

ආසියාවේ උෂ්ණ කලාපවල හා ඊසාන දිග ඕස්ට්‍රේලියාවේ ව්‍යාප්තව ඇති සුදු නෙළුම් ශාකය ශ්‍රී ලංකාවට මෙන් ම ඉන්දියාව, චීනය, ජපානය, ටිබෙටය හා අනෙකුත් ආසියාතික රටවලට ද ආවේණික වන අතර ශ්‍රී ලංකාවේ පහතරට වියළි හා තෙත් කලාපවල ද තෙත්බිම් ආශ්‍රිතව ද බහුල ලෙස ව්‍යාප්ත වේ.

**ස්වභාවය**

සෙ.මී. 5ක් පමණ පළලට වැතිරුණු රෛසෝමීය කඳක් දරන විශාල ජලජ පැළෑටියක් වන මෙහි රෛසෝමීය කඳක් වටේට පැන නැගුණු සුදු පැහැති තන්තුමය මුල් සහිතයි.

**පත්‍ර**

නෙළුම් රෛසෝමීය කඳේ උඩ පැත්තෙන් පැන නැගෙන, සෙ.මී. 25ක පමණ විශ්කම්භයකින් යුත් ජල ප්‍රතිරෝධී පෘෂ්ඨ සහිත පත්‍ර දරයි. මෙම පත්‍ර අර්ධ වක්‍රාකාරව කඳට දුර්වල නටුවකින් සම්බන්ධිතව ජල පෘෂ්ඨය මත පැතලි ලෙස පාවෙමින් හෝ කෝප්ප-ආකාර හෝ හොඳින් බොකු ගැසුණු පත්‍ර ලෙස දෘඪ නටුවක ආධාරයෙන් ජල පෘෂ්ඨයෙන් ඉහළට එසවී පවතී. තද කොළ පැහැති උඩු පැත්තක් හා ලා කොළ පැහැති යටි පැත්තක් දරන මෙම පත්‍රවල 'යටි පැත්තේ' පත්‍ර නාරටි ප්‍රමුඛ ලෙස පිටතට නෙරා ඇති අතර, නාරටි 20/21ක් පමණ පත්‍ර වෘත්තයේ සිට පිටතට විහිදී ඇත. ද්විතීක නාරටි හා ප්‍රධාන නාරටි මුසු වී ජාලයක් ලෙස සැකසී ඇත.

**පුෂ්ප**

පුෂ්පය සුදු හෝ රතු පැහැති ය. තනි තනිව ජල ස්ථරයෙන් ඉහළට නැගෙන සෙ.මී. 12 සිට 15 දක්වා විශ්කම්භයකින් යුත් විශාල පුෂ්ප වේ. මේවා ද්වි ලිංගික පුෂ්ප වන අතර පුෂ්පය මධ්‍යයේ දීප්තිමත් කහ පැහැති ඇලෙන සුළු ස්කන්ධයක් ලෙස පරාගධානි/ රේණු පිහිටා ඇති අතර ඉන් නිරතුරුව ම සුවඳ විහිදුවමින් පවතී. පුෂ්පයේ පිටතින් පිහිටා ඇති පෙති 4ක් හෝ 5ක් වන අතර ඒවා තද හෝ ලා කොළ පැහැති ය. පරවීමේ දී ඉක්මණින් හැලී යයි. ඇතුල් පෙති සුදු පැහැයක් ගන්නා අතර පාදය පැතලි වී අගින් බොතුටු ගැසී සිහින්ව පිහිටයි.

**ප්‍රයෝජන**

- බෞද්ධයින්ට හා හින්දු බැතිමතුන්ට පූජනීය පුෂ්පයක් වන නෙළුම් ආගමික, සංස්කෘතික හා ප්‍රිය සම්භාෂණ උත්සවවල දී කැපී පෙනෙන ලෙස යොදා ගැනේ.
- ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ දී මෙම ශාකයේ දණ්ඩු, අල, බීජ ආදී නොයෙකුත් කොටස් ඖෂධ සඳහා භාවිතා කරන අතර රෛසෝමීය කඳ හා බීජ ජනප්‍රිය ආහාරයක් ලෙස ද පවතී.
- පත්‍රවල ඇති ජලය නොරඳන ස්වභාවය හේතුවෙන්, පිඟන් වෙනුවට ආදේශකයක් ලෙස නෙළුම් පත්‍ර භාවිතය ගැමි ජනතාව අතර ප්‍රචලිත ය. (විශේෂයෙන් කුඹුරු වැඩ හා වන්දනා ගමන්වල දී යොදා ගනිති.)

  නෙළුම් මල පෞරාණික කැටයම් හා කලා ශිල්පවල ද බහුලව දක්නට ලැබේ.

## 10. හීන් බෝවිටියා

*Osbeckia octandra*



'Melastomataceae' කුලයට අයත්, 'Osbeckia' ඝනයට අයත්, හීන් බෝවිටියා ඒකදේශික ශාකයකි. ශ්‍රී ලංකාවේ වියළි කඳුකර කලාපවල බහුවල දක්නට ඇත.

**ස්වභාවය**

මීටර් 2ක් පමණ උසැති පඳුරකි. කඳ කෙඳි වැනි කොටස්වලට පතුරු ගැසී ඇති අතර ලා රතු පැහැයට හුරු දුඹුරු පැහැයක් ගනී.

**පත්‍ර**

පත්‍ර ඉලිප්සාකාර වන අතර පත්‍ර පාදය පැහැදිලි රවුම් හැඩයක් ගනී. පත්‍ර වෘන්තය මි.මී. 1 සිට 5 දක්වා දිගු ය. පත්‍රයේ පැහැදිලි නාරටි තුනකි. පත්‍රයේ උඩු හා යටි පැත්තේ ද පත්‍ර දාරයේ ද රෝම වැනි කෙඳි සහිත ය.

**පුෂ්ප**

රෝස - දම් පැහැයක් ගන්නා සවෘන්ත පුෂ්ප වන අතර පෙති 5 කින් යුක්ත ය. ඉත්තක මල් කුඩා ප්‍රමාණයක් දරන අතර ලිහිල්ව පොකුරු ගැසී ඇත. මි.මී. 2 සිට 4 දක්වා ප්‍රමාණයේ ත්‍රිකෝණාකාර මණිපත්‍ර දරයි. දල පත්‍ර (පෙති) මි.මී. 15 සිට 19 දක්වා තරම් වේ.

**ප්‍රයෝජන**

- විසිතුරු පැළෑටියක් ලෙස ගෙවතු අලංකරනයට යොදා ගැනේ.
- ශාකයේ කොළ හා පොතු ඖෂධ ලෙස භාවිතා කෙරේ.
- ජන කවි හා ජන සංගීතයට ද බෝවිටියා පුෂ්පය තේමා වී ඇත.

# පරිශීලන ග්‍රන්ථ


1. Dasanayaka M. D., F. R. Fosberg (1980, 1981, 1985, 1987, 1991). A revised hand book to the "Flora of Ceylon". Volume I, II, V, VI, VII, Oxford & IBH Publishing Co. New Delhi.

2. Dasanayaka M. D., Clayton W. D. (1996, 1997, 2000) A revised hand book to the " Flora of Ceylon". Volume X, XIII, XIV. Oxford & IBH Publishing Co. New Delhi.

3. Sumithrarachchi D. B., Ratnayaka H. D., Ekanayaka H. D. (1995). "Beautiful Wild Flowers of Sri Lanka". Publication of Royal Botanic Gardens.

4. මලික් ප්‍රනාන්දු, සිරිල් විජේසුන්දර, සුරන්ජන් ප්‍රනාන්දු. (2003). 'ශ්‍රී ලංකාවේ උඩවැඩියා'. ලෝක සංරක්ෂණ සංගමයේ ප්‍රකාශනයකි.

5. මාක් ඈෂ්ටන්, සාවිත්‍රී ගුණතිලක, නීලා ද සොයිසා, එම්. ඩී. දසනායක, නිමල් ගුණතිලක, සිරිල් විජේසුන්දර, අතුල විජයසිංහ (2004). සිරිලක ගස් කොළන් අත්පොත; ශ්‍රී ලංකා වන ජීවී උරුම භාරය, කොළඹ 08.

6. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාවට නැංවීම සඳහා කාර්ය රාමුවක් (1999), වන සම්පත් හා පාරිසරික අමාත්‍යාංශය.

7. S. R. Kottegoda (1994). Flowers of Sri Lanka. Publication of the Royal asiatic of Sri - Lanka.

## සටහන්

## සටහන්

LIBRARY
MINISTRY OF ENVIRONMENT

ISBN 955-9120-40-9